**විශේෂ සටහන 15**

## ප්‍රධාන ආර්ථික ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග - 2006 -2007 (අ)

### මූර්ත අංශය

| | |
|---|---|
| 2006 පෙබරවාරි 01 | - විදුලි බිල්පත් සඳහා වන ස්ථාවර විදුලි ගාස්තුව සියයට 100 සහ සියයට 275 අතර ප්‍රමාණයකින් ඉහළ දමන ලදී. |
| 2006 අප්‍රේල් 15 | - පෙට්‍රල්, ඩීසල් සහ භූමිතෙල් ලීටරයක් සඳහා වන සිල්ලර මිල ගණන් පිළිවෙලින් රුපියල් 88.00, රුපියල් 58.00 සහ රුපියල් 38.50 දක්වා රුපියල් 8.00 කින් ඉහළ දමන ලදී. |
| 2006 අප්‍රේල් 24 | - මගී බස් ගාස්තු සියයට 16 කින් ඉහළ දමන ලදී. |
| 2006 ජූනි 10 | - පෙට්‍රල් සහ භූමිතෙල් ලීටරයක් සඳහා වන සිල්ලර මිළ ගණන් පිළිවෙලින් රුපියල් 93.00 සහ 43.50 දක්වා ලීටරයකට රුපියල් 5.00 බැගින් ඉහළ දමන ලදී. |
| | - ඩීසල් සඳහා වන සිල්ලර මිල ලීටරයකට රුපියල් 61 දක්වා රුපියල් 3 කින් වැඩි කරන ලදී. |
| 2006 ජූලි | - තෙල් සමාගම්වලට පිරිවැය අනුව ඛනිජ තෙල් මිල ගණන් තීරණය කිරීමට ඉඩකඩ සලසමින් රජය විසින් ඛනිජ තෙල් සහනාධාර ලබාදීම අත්හිටුවන ලදී. |
| 2006 සැප්තැම්බර් 01 | - විදුලි ගාස්තු සියයට 30 කින් පමණ ඉහළ දමන ලදී. |
| 2006 ඔක්තෝබර් | - විදේශ ගුවන් තැපැල් ගාස්තු ඉහළ දමන ලදී. |
| 2007 පෙබරවාරි 01 | - ගෘහස්ථ, පූජනීය ස්ථාන සහ පුණ්‍යායතනයන්හි විදුලි ගාස්තු සියයට 13 කින් පමණ ඉහළ දමන ලදී. |

### විදේශ අංශය

**වෙළෙඳ හා තීරු බදු**

| | |
|---|---|
| 2006 ජනවාරි 31 | - තිරිඟු පිටි ආනයනය මත පනවා තිබූ සියයට 2.5 ක තීරු බද්ද සියයට 15 දක්වා හෝ කිලෝ ග්‍රෑමයකට රුපියල් 12.50 (දෙකෙන් වැඩි අගය) දක්වා වැඩි කරන ලදී. |
| | - සහල් ආනයනය මත පනවා තිබූ කිලෝ ග්‍රෑමයකට රුපියල් 9.00 වූ තීරු බද්ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 20.00 දක්වා වැඩි කරන ලදී. |
| 2006 පෙබරවාරි 28 | - තිරිඟු ඇට ආනයනය සඳහා වන තීරු බද්ද සියයට 2.5 සිට සියයට 6 දක්වා වැඩි කරන ලදී. |
| 2006 අප්‍රේල් 18 | - තේ අපනයනය මත පනවා තිබූ සෙස් බද්ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 2.50 සිට රුපියල් 4.00 දක්වා ඉහළ දමන ලදී. |
| | - ඉදිකිරීම් යන්ත්‍ර සූත්‍ර ආනයනය තීරු බද්දෙන් නිදහස් කරන ලදී. |
| 2006 අගෝස්තු 04 | - ලොකු ළූණු ආනයනය සඳහා වන තීරු බද්ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 10.00 සිට රුපියල් 20.00 දක්වා වැඩි කරන ලදී. |
| 2006 සැප්තැම්බර් 16 | - ලොකු ලූණු ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රුපියල් 10.00 ක වූ සෙස් බද්දක් පනවන ලදී. |
| | - 1979 අංක 40 දරන අපනයන සංවර්ධන මණ්ඩල පනතේ 14 වන වගන්තිය යටතේ මෝටර් රථ වාහන සහ ලිහිසි තෙල් (Lubricant Oil) ඇතුළුව තෝරාගත් ආනයන ද්‍රව්‍ය මත ආනයන සෙස් බද්දක් පනවන ලදී. මීට අමතරව, එතාක් පැවති සෙස් බදු අනුපාතයන්ද සංශෝධනය කරන ලදී. |
| 2006 ඔක්තෝබර් 25 | - පෙට්‍රල් ආනයනයේදී ලීටරයකට රුපියල් 5.00 ක තීරු බද්දක් පනවන ලදී. |
| 2006 නොවැම්බර් 07 | - කිලෝ ග්‍රෑමයකට රුපියල් 4.50 බැගින් සුදු සීනි ආනයනයේදී ලබාදෙන ලද බදු සහනය ඉවත් කරන ලදී. |
| 2006 නොවැම්බර් 17 | - සුදු සීනි ආනයනයේදී අය කරනු ලබන තීරු බද්ද කිලෝ ග්‍රෑමයකට රුපියල් 4.50 සිට රුපියල් 10.00 දක්වා ඉහළ දමන ලද අතර ඊට අදාළව කිලෝ ග්‍රෑමයකට සියයට 50 ක බදු සහනයක් ප්‍රදානය කරන ලදී. |

(අ) 2006 වසර තුළදී සහ 2007 වසරේ මුල් මාස තුන තුළදී ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිමය වෙනස්වීම් සහ ක්‍රියාමාර්ග මෙන්ම 2007 වසරේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රතිපත්තිමය වෙනස්වීම් හා ක්‍රියාමාර්ග ද ඇතුළත් වේ.

| | |
|---|---|
| | - නැව් ආනයනයේදී පැවති තීරු බද්ද ඉවත් කරන ලදී. |
| | - එළ හරකුන්, මී හරකුන්, කුකුලන්, ඌරන්, එළුවන් සහ බැටළුවන් අභිජනන සතුන් ආනයනය කිරීම හා ඔවුන්ගේ අභිජනන ද්‍රව්‍ය ආනයනය කිරීම තීරු ගාස්තු වලින් නිදහස් කරන ලදී. |
| | - රන් භාණ්ඩ, රන්කරුවන්ගේ භාණ්ඩ සහ කෘත්‍රිම ස්වර්ණාභරණ ආනයනයේදී සියයට 15 ක සෙස් බද්දක් පනවන ලදී. |
| | - පාවහන් ආනයනයේදී පනවා තිබූ ජෝඩුවකට රුපියල් 110.00 හෝ වටිනාකමින් සියයට 25 ක් වූ සෙස් බද්ද ජෝඩුවකට රුපියල් 300.00 හෝ වටිනාකමින් සියයට 25 ක් (දෙකෙන් වැඩි අගය) දක්වා ඉහළ දමන ලදී. |
| | - නිෂ්පාදන පුවරු සහ ඊට සමාන පුවරු නිෂ්පාදනයේදී යොදා ගනු ලබන තෝරාගත් අමු ද්‍රව්‍ය ආනයනයේදී අයකරනු ලබන සෙස් බද්ද ඉහළ දමන ලදී. |
| | - දේශීය චිත්‍රපට කර්මාන්තයේදී උපයෝගි කරගනු ලබන තෝරාගත් ආනයන ද්‍රව්‍ය මත පනවා තිබූ තීරු බද්ද ඉවත් කරන ලදී. |
| | - තේ කර්මාන්තයේ සහ ආහාර හෝ පාන වර්ග නිෂ්පාදනයේ සහ සකස් කිරීමේ යෙදෙන කර්මාන්තශාලා නවීකරණය සඳහා ආනයනය කරනු ලබන යන්ත්‍රෝපකරණ තීරු බදු වලින් නිදහස් කරන ලදී. |
| | - කුනිස්සන් සහ ඉස්සන් ආනයනයේදී වටිනාකම මත සියයට 20 ක හෝ කිලෝග්‍රෑමයකට රුපියල් 50.00 ක (දෙකෙන් වැඩි අගය) සෙස් බද්දක් පනවන ලදී. |
| | - ඉස්සන් වගාවේදී උපයෝගී කරගනු ලබන තෝරාගත් භාණ්ඩ ආනයනයේදී පනවා තිබූ තීරු බද්ද ඉවත් කරන ලදී. |
| | - කුකුළු පාලන යන්ත්‍රෝපකරණ, බිත්තර රකින උපකරණ සහ බිත්තර රකින ස්ථාන ආනයනය තීරුබදු වලින් නිදහස් කරන ලදී. |
| | - සුවඳ විලවුන් සහ වැසිකිළි පිරිසිදුකරණ, විදුලි බුබුළු, සබන්, ලිහිසි තෙල්, රූපවාහිනී යන්ත්‍ර සහ ගුවන් විදුලි යන්ත්‍ර සඳහා වන සෙස් බද්ද ඉහළ නංවන ලදී. |
| | - ත්‍රී රෝද රථ හැර නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්දට යටත්වන වාහන සඳහා සියයට 2.5 ක ප්‍රාදේශීය යටිතල පහසුකම් සංවර්ධන බද්දක් පනවන ලදී. |
| 2006 දෙසැම්බර් 04 | - අර්තාපල් ආනයනයේදී කිලෝ ග්‍රෑමයකට රුපියල් 1.50 ක් වශයෙන් ලබා දී තිබූ තීරු බදු සහනය 2006 දෙසැම්බර් 04 දින පූර්ණ බදු සහනයක් ඇතිවන පරිදි කිලෝ ග්‍රෑමයකට රුපියල් 20.00 දක්වා ඉහළ දමන ලදී. |
| | - 2006 දෙසැම්බර් මස 04 දින සිට 2007 ජනවාරි 31 දින තෙක් බී ලූණු ආනයනයේදී කිලෝ ග්‍රෑමයකට රුපියල් 20.00 ක පූර්ණ බදු නිදහසක් ලබාදෙන ලදී. |
| 2006 දෙසැම්බර් 11 | - තෝරාගත් ආහාර ද්‍රව්‍ය එනම්, කරවල, උම්බලකඩ, රතු ලූණු, කඩල, මුං ඇට, කව්පි සහ වියළි මිරිස් ආනයනයේදී, 2007 ජනවාරි 31 වන දින තෙක් පූර්ණ බදු නිදහසක් ප්‍රදානය කරන ලදී. |
| | - තිරිඟු පිටි ආනයනයේදී කිලෝ ග්‍රෑමයකට රුපියල් 5.00 ක ආංශික බදු නිදහසක් ලබාදෙන ලදී. එහෙයින් තිරිඟු පිටි සඳහා අදාළ වන තීරු බද්ද 2006 දෙසැම්බර් 11 වන දින සිට 2007 ජනවාරි 31 වන දින තෙක් වටිනාකම මත සියයට 9 ක් හෝ කිලෝ ග්‍රෑමයකට රුපියල් 7.50 ක් (දෙකෙන් වැඩි අගය) ලෙස වෙනස් කරන ලදී. |
| 2006 දෙසැම්බර් 17 | - බී ළූනු ආනයනයේදී පැවති සඳහා රුපියල් 10.00 සෙස් බද්ද ඉවත් කරන ලදී. |
| 2007 ජනවාරි 31 | - තෝරාගත් ආහාර ද්‍රව්‍ය එනම් කරවල, උම්බලකඩ, රතුලූණු, කඩල, මුං ඇට, කව්පි සහ වියළි මිරිස් ආනයනයේදී 2007 ජනවාරි 31 දින තෙක් ලබා දී තිබූ පූර්ණ බදු සහනය 2007 පෙබරවාරි 15 දින තෙක් දීර්ඝ කරන ලදී. |
| 2007 පෙබරවාරි 02 | - පෙට්‍රල් ආනයනය මත වන තීරු බද්ද ලීටරයකට රුපියල් 5.00 සිට රුපියල් 20.00 දක්වා ඉහළ දමන ලදී. |
| 2007 පෙබරවාරි 14 | - පෙට්‍රල් ආනයනයේදී ලීටරයකට රුපියල් 15.00 බැගින් වූ බදු නිදහසක් මාසයක කාලයක් සඳහා ලබාදෙන ලදී. |

**විදේශ විනිමය කළමනාකරණය**

2006 ඔක්තෝබර් 03

- මුදල් හුවමාරු කරන්නන් සඳහා නව නිර්ණායකයන් නිකුත් කරන ලදී. ඒ අනුව,
  - අවම වශයෙන් රුපියල් දශ ලක්ෂයක නිකුත් කරන ලද සහ ගෙවා නිමි ප්‍රාග්ධනයක් සහිතව ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත මූල්‍ය සමාගම්වලට පමණක් මුදල් හුවමාරු කටයුතු සඳහා සහභාගීවීමට අවසර දෙන ලදී.
  - මුදල් හුවමාරු කටයුතු සඳහා වන අවසරය තවත් ඉදිරි කාල පරිච්ඡේදයකට දීර්ඝ කිරීම සළකා බැලීම පිණිස අවම වශයෙන් මාසයකට ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් 10,000 ක පමණ සාමාන්‍ය මාසික පිරිවැටුමක් අවශ්‍ය වනු ඇත.

2006 දෙසැම්බර්

- පහත සඳහන් නව විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වර්ග දෙක හඳුන්වා දෙන ලදී.
  - වෘත්තීමය සේවාවන් සැපයීමේ යෙදී සිටින පුද්ගලයන් සඳහා වෘත්තීමය සේවාවන් සපයන්නන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම (FCAPS)
  - ආයෝජන මණ්ඩලය යටතේ ඇති සමාගම ද ඇතුළුව ඕනෑම විදේශ ව්‍යවහාර මුදල් උපයන සමාගමක් සඳහා යෙදවුම් සපයන්නන් සඳහා වන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම (FCASE)

2007 ජනවාරි 01

- මුදල් හුවමාරු කරන්නන්ගේ බලපත්‍රය දීර්ඝ කිරීම සඳහා අවශ්‍ය කරන අවම සාමාන්‍ය මාසික පිරිවැටුම වර්ෂයකට එ.ජ. ඩොලර් 10,000 සිට එ.ජ. ඩොලර් 50,000 දක්වා ඉහළ දමන ලදී.
- සංචාරක චෙක්පත් මුදල් කිරීම සඳහා මුදල් හුවමාරු කරන්නන්ට අවසර ලබාදෙන ලදී.

2007 ජනවාරි 08

- ද්විත්ව පුරවැසිභාවය සඳහා අයදුම්කරනු ලබන, ශ්‍රී ලංකාව හැර ගිය අය/විදේශ රටවල ජීවත් වන ශ්‍රී ලාංකිකයන් සඳහා විදේශ ව්‍යවහාර මුදල් ස්ථාවර තැන්පත් ගිණුමක් හඳුන්වාදෙන ලදී.

**රාජ්‍ය මූල්‍ය අංශය**

**රජයේ ආදායම**

2006 ජනවාරි 01

- වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද සියයට 1.5 සිට සියයට 2.5 දක්වා වැඩි කරන ලදී.
- සමාජීය වගකීම් ගාස්තු (Social Responsibility Levy) අනුපාතය සියයට 0.25 සිට සියයට 1 දක්වා වැඩි කරන ලදී.
- මූල්‍ය සේවා සඳහා වන එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 20 දක්වා වැඩි කරන ලදී.
- ඖෂධීය ගුණයෙන් යුතු දේශීයව නිෂ්පාදනය කරනු ලබන ජින්ජර් බියර්, පේයාව සහ තෙල්ලි වැනි බීම වර්ග සඳහා එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 20 සිට සියයට 15 දක්වා අඩුකරන ලදී.
- මත්පැන් අලෙවිසැල් සඳහා අය කරනු ලබන වාර්ෂික බලපත්‍ර ගාස්තුව ඉහළ දමන ලදී.
- ටවර්හෝල් රඟහල පදනම මගින් කරනු ලබන සේවා, ශ්‍රී ලංකාව තුළ වගා කරනු ලබන ධාන්‍ය වලින් සකස් කරන ලද ආහාර, ආබාධිත පුද්ගලයන් විසින් භාවිතා කරනු ලබන උපකරණ සහ ශ්‍රී ලංකා ධජය යටතේ ලියාපදිංචි කර ඇති නැව් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- කිරි සැකසුම් යන්ත්‍ර සහ සකස් නොකරන ලද ලී කොටන් ආනයනය එකතුකළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කවලින් පිටත පිහිටුවනු නව කර්මාන්ත සඳහා ආනයනය කරනු ලබන යන්ත්‍ර සහ උපකරණ එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
- සියළුම ජාත්‍යන්තර ක්‍රීඩා තරඟ ආදායම් බදු වලින් නිදහස් කරන ලදී.
- එකතු කළ අගය මත බදු ගණනය කිරීමේදී පිරිවැය, රක්ෂණ හා ගැල් කුලී ඇතුළත් මිලට (CIF Value) රේගුවේදී එකතු කරනු ලබන ආන්තිකය (Markup) සියයට 5 සිට සියයට 7 දක්වා වැඩි කරන ලදී.

- අපනයනකරුවන්ට බදු ප්‍රතිදාන ලබා දීම සඳහා නියම කර ඇති කාල සීමාව දින 30 සිට දින 15 දක්වා අඩුකරන ලදී.
- සෘජු අපනයනකරුවන්ට ලබාදී ඇති එකතු කළ අගය මත බදු තාවකාලිකව නතර කිරීමේ පහසුකම අපනයන සඳහා භාණ්ඩ නිෂ්පාදන යොදාගන්නා ප්‍රාග්ධන භාණ්ඩ ආනයනය සඳහා සහ ඇඟළුම් පංගු මණ්ඩලයෙහි ලියාපදිංචි වක්‍ර අපනයනකරුවන් විසින් කරනු ලබන අමුද්‍රව්‍ය ආනයනය සඳහා ද ලබාදෙන ලදී.

**2006 අප්‍රේල් 01**

- පුද්ගල ආදායම් බදු අනුපාත පහත සඳහන් පරිදි සංශෝධනය කරන ලදී.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (1) පළමු රුපියල් | 3,000,000 | = | නැත | (2) ඊළඟ රුපියල් | 300,000 | = | සියයට 5 |
| (3) ඊළඟ රුපියල් | 200,000 | = | සියයට 10 | (4) ඊළඟ රුපියල් | 200,000 | = | සියයට 15 |
| (5) ඊළඟ රුපියල් | 200,000 | = | සියයට 20 | (6) ඊළඟ රුපියල් | 200,000 | = | සියයට 25 |
| (7) ඊළඟ රුපියල් | 500,000 | = | සියයට 30 | (8) ඉතිරි ප්‍රමාණය | | = | සියයට 35 |

- සාමුහික ආදායම් බදු ක්‍රමයට පහත සඳහන් සංශෝධනයන් හඳුන්වා දෙන ලදී.
  - සමූපකාර සංගම් සඳහා අදාළ සාමුහික ආදායම් බදු අනුපාතය සියයට 20 සිට සියයට 15 දක්වා අඩුකරන ලදී.
  - කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ගේ රුපියල් දශ ලක්ෂ 5 නොඉක්මවන බදු අයකළ හැකි ආදායම් මත බදු අනුපාතය සියයට 20 සිට සියයට 15 දක්වා අඩු කරන ලදී.
  - බදු අයකළ හැකි ආදායම රුපියල් දශ ලක්ෂ 5 ඉක්මවන සමාගම් සඳහා අදාළ බදු අනුපාතය සියයට 35 දක්වා ඉහළ දමන ලදී.
  - කොටස් වෙළෙඳපොළේ අළුතින් ලියාපදිංචි වන සමාගම් සඳහා ලියාපදිංචි වී ඇති පළමු අවුරුදු 5 ක කාලය තුළ අය කරන බදු අනුපාතය සියයට 33 1/3 ක් ලෙස නියම කරන ලදී.
  - සූදු සහ ක්ෂණික ලොතරැයි ව්‍යාපාර වලින් ලබන ආදායම් සහ ලාභ මත අය කෙරෙන සාමුහික ආදායම් බදු අනුපාතය සියයට 40 ක් ලෙස නියම කරන ලදී.
  - කොළඹ සහ ගම්පහ දිස්ත්‍රික්කයන්ගෙන් පිටත පිහිටුවනු ලබන සමාගම් අවුරුදු 5 - 10 දක්වා කාලයක් ආදායම් බද්දෙන් නිදහස් කරන ලදී.
- ජාතිය ගොඩ නැගීමේ බැඳුම්කර හිමිකරුවන්ට සහ නියමානුකූලව බදු ගෙවන්නන් සඳහා මෝටර් රථ ආනයනයේදී සහනදායි බද්දක් හඳුන්වා දෙන ලදී.

**2006 අප්‍රේල් 04**

- ණයවර ලිපි, හර බදු, වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්දට යටත් වන සහ කොටස් ගනුදෙනු සඳහා වන ලියකියවිලි හැර අනෙකුත් උපකරණ හා ලියවිලි සඳහා මුද්දර බද්ද නැවත හඳුන්වාදෙන ලදී.

**2006 අප්‍රේල්**

- පහත සඳහන් පනත් බල පැවැත්වීම ආරම්භ විය.
  - 2006 අංක 10 දරණ දේශීය ආදායම් පනත
  - 2006 අංක 13 දරණ ආර්ථික සේවා ගාස්තු පනත
  - 2006 අංක 12 දරණ මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත
  - 2006 අංක 14 දරණ සූදු හා ඔට්ටු ඇල්ලීමේ ගාස්තු (සංශෝධන) පනත
  - 2006 අංක 15 දරන බැංකු (සංශෝධන) පනත
  - 2006 අංක 13 දරණ මුදල් නීති (සංශෝධන) පනත

**2006 ජූලි 24**

- සිංහල හඬකවන ලද විදේශීය ටෙලි නාට්‍ය හෝ චිත්‍රපට සඳහා චිත්‍රපට හා වාණිජ බද්දක් පනවන ලදී.

**2006 ඔක්තෝබර් 05**

- සිගරට්වල දිග ප්‍රමාණය අනුව සිගරට් සඳහා වන නිෂ්පාදන බද්ද ඉහළ දමන ලදී.
- මත්පැන් සඳහා වන නිෂ්පාදන බද්ද ඉහළ දමන ලදී.
- සිලින්ඩර් ධාරිතාවය 1,600 ක් නොඉක්මවන වාහන ආනයනය සඳහා වන නිෂ්පාදන බද්ද සියයට 60 සිට සියයට 40 දක්වා අඩු කරන ලදී.

- සිලින්ඩර් ධාරිතාවය 1,600 ක් නොඉක්මවන ස්ටේෂන් වැගන් සහ රේසින් කාර් ඇතුළු මෝටර් වාහන ආනයනය සඳහා වන නිෂ්පාදන බද්ද සියයට 115 සිට සියයට 95 දක්වා අඩුකරන ලදී.

2006 ඔක්තෝබර් 25 - භූමිතෙල් සඳහා ලීටරයකට රුපියල් 1.25 ක්වූ නිෂ්පාදන බද්ද ඉවත් කරන ලදී.

2006 නොවැම්බර් 16 - තෝරාගත් භාණ්ඩ වර්ග සහ රථවාහන සඳහා වන නිෂ්පාදන බද්ද සංශෝධනය කරන ලදී.

2006 නොවැම්බර් 17 - ආනයන සඳහා එකතු කළ අගය මත බදු, සෙස් සහ නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු ගණනය කිරීමේදී පිරිවැය, රක්ෂණය හා ගැල් කුලී ඇතුළත් වටිනාකමට රේගුවේදී එකතු කරනු ලබන ආන්තිකය සියයට 7 සිට සියයට 10 දක්වා වැඩි කරන ලදී.

- වසර 7 කට වඩා පැරණි තෝරාගත් බර යන්ත්‍ර සූත්‍ර ආනයනය කිරීමට ඉඩසලසමින් පාවිච්චි කරන ලද ඉදිකිරීම් යන්ත්‍ර සූත්‍ර ආනයනය කිරීම සඳහා බලපත්‍ර ලබා ගැනීමේ අවශ්‍යතාවය ලිහිල් කරන ලදී.

- වරාය සහ ගුවන් තොටුපොළ සංවර්ධන බද්ද සියයට 2.5 සිට සියයට 3.0 දක්වා ඉහළ දමන ලදී.

- තීන්ත ආලේප සහ මයික්‍රෝන් 40 ට අඩු පොලිතීන් ආනයනය සඳහා සියයට 5 ක නිෂ්පාදන බද්දක් පනවන ලදී.

- කාබනේටඩ් බීම වර්ග ආනයනය සඳහා සියයට 6 ක නිෂ්පාදන බද්දක් පනවන ලදී.

2007 ජනවාරි 01 - එකතු කළ අගය මත බදු පැනවීම සඳහා වන රුපියල් දශ ලක්ෂ 1.8 ක් වන සීමාව ආසන්නයේ සිටින ආයතන සඳහා ආපසු නොගෙවනු ලබන සියයට 5 ක බද්දක් පනවන ලදී.

- පහත සඳහන් අයිතමයන් එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කරන ලදී.
    - දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන අත්‍යන්ත්‍ර රෙදිපිළි සැපයීම.
    - ලංකා විදුලිබල මණ්ඩලය මගින් ආනයනය කරනු ලබන යන්ත්‍රසූත්‍ර
    - නියමිත මාර්ග අවසරපතක් හිමි ඕනෑම බස් හිමියකු විසින් ආනයනය කරනු ලබන ඕනෑම බස් රථයක්.
    - කර්මාන්තශාලා නවීකරණය කිරීම සඳහා ආනයනය කරනු ලබන යන්ත්‍ර සූත්‍ර (තේ කර්මාන්තය සඳහා වන යන්ත්‍ර සූත්‍ර, ආහාර හා බීම වර්ග සැකසීම හා නිෂ්පාදනය සඳහා වන යන්ත්‍ර සූත්‍ර සහ පොල් ලෙලි ගැසීමේ උපකරණ)
    - ඇවිතෙල්
    - අභිජනන සතුන් හා ද්‍රව්‍යයන්
    - විදුලිබල උත්පාදනය හා බෙදාහැරීම
    - නැව් කුලියට ගැනීම
    - ඕනෑම චිත්‍රපටයක් නිෂ්පාදනය, බෙදාහැරීම සහ ප්‍රදර්ශනය කිරීම සහ චිත්‍රපටයක් නිෂ්පාදනය කිරීම සඳහා චිත්‍රාගාර පහසුකම් සැපයීම.
    - ස්වර්ණාභරණ

- පහත සඳහන් අයිතමයන් සඳහා වන එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 5 දක්වා අඩු කරන ලදී.
    - ඉහළ තාක්ෂණයෙන් යුතු වෛද්‍ය උපකරණ
    - ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේ යන්ත්‍ර නිෂ්පාදනය කරනු ලබන යන්ත්‍ර
    - ජාතික චිත්‍රපට සංස්ථාවේ අනුමැතිය ඇතිව, චිත්‍රපට කර්මාන්තය සඳහා ආනයනය කරනු ලබන තෝරාගත් අයිතමයන්

- ඒකක භාර සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකු මුද්දර බද්දෙන් නිදහස් කරන ලදී.

2007 ජනවාරි 02 - සමෘද්ධි අධිකාරිය, දිස්ත්‍රික් මහ ලේකම් කාර්යාලයක් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් මගින් ලංකා බැංකුවෙහි හෝ මහජන බැංකුවෙහි පවත්වාගෙන යනු ලබන ගිණුම් හර බද්දෙන් නිදහස් කරන ලදී.

**2007 අපේක්ෂිත**

2007 අප්‍රේල් 01

- ආර්ථික සේවා ගාස්තුව ගණනය කිරීම සඳහා අදාළ පිරිවැටුම් සීමාව රුපියල් දශ ලක්ෂ 10 සිට රුපියල් දශ ලක්ෂ 7.5 දක්වා අඩු කිරීම.
- නිමැවුම් කර්මාන්තය හා සම්බන්ධ වෙළෙඳාමක් හෝ ව්‍යාපාරයක් එහි ක්‍රියාකාරකම් ආරම්භයේ සිට වසර 3 ක් දක්වා වෙළෙඳ හෝ ව්‍යාපාරික විකුණුම් සඳහා ආර්ථික සේවා ගාස්තු අය නොකිරීම.
- අන්තරාල වෙළෙඳාම්, එතෙර ගනුදෙනුවල විකුණුම් සහ වසා තබන ලද කර්මාන්තශාලා නැවත ආරම්භ කිරීම (නැවත ආරම්භකර වසර 3 ක් සම්පූර්ණ වූ පසු) ආර්ථික සේවා ගාස්තුවෙන් නිදහස් කිරීම.
- ඒකක භාර සඳහා අදාළ වන ආරක්ෂක සේවා ගාස්තුව සියයට 0.5 ක් බවට පත්කිරීම.
- සේවා නියුක්තිකයන්ගේ සේවාන්ත ප්‍රතිලාභ සඳහා වන බදු තල පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ඇත.
  - සේවා දායකත්වය ලබා දී ඇති කාල සීමාව අවුරුදු 20 ට වඩා වැඩිවන විට පහත අනුපාත අදාළ වනු ඇත.
    - පළමු රුපියල් 5,000,000 = නැත
    - ඊළඟ රුපියල් 1,000,000 = සියයට 5
    - ඉතිරිය = සියයට 10
  - දායකත්වය ලබා දී ඇති කාල සීමාව අවුරුදු 20 ට අඩුවන විට පහත අනුපාත අදාළ වනු ඇත.
    - පළමු රුපියල් 2,000,000 = නැත
    - ඊළඟ රුපියල් 1,000,000 = සියයට 5
    - ඉතිරිය = සියයට 10
- ඉදිකිරීම් කර්මාන්තය සඳහා යොදාගනු ලබන යන්ත්‍රසූත්‍ර සඳහා වන ක්ෂයවීම් දීමනාව සියයට 12.5 සිට සියයට 25 දක්වා වැඩි කිරීම.
- උපදේශක ගාස්තු සඳහා වන රඳවා තබා ගැනීමේ බද්ද සියයට 5 සිට සියයට 1 දක්වා අඩු කිරීම.
- ශ්‍රී ලංකාවෙන් පිටත ඉදිකිරීමේ කටයුතුවල නිරතවන ඕනෑම පුද්ගලයකුගේ ලාභ විදේශ මුදලින් ගෙවනු ලබන්නේ නම් හා බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන්නේ නම් එම ලාභය ආදායම් බද්දෙන් නිදහස් කිරීම.
- ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් ගාස්තුවේ පරිපාලන කටයුතු කිරීමේ බලය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස්ට ජනරාල්වරයාට පැවරීම.

**රජයේ වියදම**

2006 ජනවාරි 01

- සියළුම රජයේ සේවකයන්ට වැටුප් වැඩිවීමක් ලබාදෙන ලදී.
- පොලිසිය සහ හමුදාවල සාමාජිකයන් ඇතුලුව සියලුම රජයේ සේවකයන්ට රුපියල් 1,000 ක ජීවන වියදම් දීමනාවක් හා විශ්‍රාමිකයන් සඳහා රුපියල් 500 ක ජීවන වියදම් දීමනාවක් ලබාදෙන ලදී.
- විශ්‍රාම වැටුප් සහිත රජයේ සේවකයන්ට ඔවුන් විසින් ලබා නොගන්නා ලද නිවාඩුවලට හිලව් කිරීම සඳහා දිරි දීමනාවක් ලබාදීම ආරම්භ කරන ලදී.
- විශ්‍රාමිකයන් සඳහා ගෙවන ලද තාවකාලික දීමනාව ඒකාබද්ධ කළ අතර අඩුකිරීම් නොකරන ලද විශ්‍රාම වැටුප මත සියයට 10 ක විශ්‍රාම වැටුප් වැඩිවීමක් ලබාදෙන ලදී.

2006 මැයි 05

- සුළු පරිමාණ තේ, රබර් හා පොල් වගාකරුවන් සඳහා පොහොර සහනාධාරය ලබාදීම ආරම්භ කරන ලදී.

2006 නොවැම්බර්

- මව්වරුන් හා දරුවන් සඳහා පෝෂණ වැඩ සටහනක් ආරම්භ කරන ලදී.

**රාජ්‍ය ණය**

| | |
|---|---|
| 2006 පෙබරවාරි 01 | - විදේශීය ව්‍යවහාර මුදල් වලින් ආයක විය හැකි ශ්‍රී ලංකා ජාතිය ගොඩ නැගීමේ බැඳුම්කර (Sri Lanka Nation Building Bonds) අනේවාසික ශ්‍රී ලාංකිකයන් හට නිකුත් කිරීම ආරම්භ කරන ලදී. |
| 2006 මැයි 29 | - ශ්‍රී ලංකාවෙන් පිටත ස්ථිරව පදිංචිව සිටින ශ්‍රී ලංකාවේ ද්විත්ව පුරවැසිභාවය ලබා සිටින ශ්‍රී ලාංකිකයන්ට ද ලබා ගැනීමට අවසර ලබා දෙමින් ජාතිය ගොඩ නැගීමේ බැඳුම්කර වල ආයෝජන පදනම පුළුල් කරන ලදී. |
| 2006 ජූලි 01 | - ප්‍රාථමික වෙළෙඳුන් සඳහා වන අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය රුපියල් දශ ලක්ෂ 250 සිට රුපියල් දශ ලක්ෂ 300 දක්වා වැඩි කරන ලදී. |
| | - ප්‍රාථමික වෙළෙඳුන් සඳහා අවදානම් මත බර තැබූ අවම ප්‍රාග්ධන අවශ්‍යතා රාමුව හඳුන්වාදෙන ලදී. |
| 2006 ජූලි 21 | - රක්ෂණ කර්මාන්ත රෙගුලාසි පනත යටතේ ලියාපදිංචි විශේෂිත රක්ෂණ සමාගම් ඇතුලත් කිරීම මගින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන පදනම පුළුල් කරන ලදී. |
| 2006 නොවැම්බර් 01 | - නොපියවූ ඇති මුළු භාණ්ඩාගාර බිල්පත් වටිනාකමින් සියයට 5 ක් දක්වා වන භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළ විදේශ ආයෝජකයන් සඳහා රජය විසින් විවෘත කරන ලදී. |
| 2007 ජනවාරි | - භාණ්ඩාගාර බැඳුම්කර වෙළෙඳපොළේ විදේශ සහභාගීත්වය සම්බන්ධයෙන් වන නීතිමය අවශ්‍යතාවයන් නිකුත් කරන ලදී. |
| 2007 පෙබරවාරි | - අඩු වටිනාකම් ඇති එක් දින ප්‍රති මිලදී ගැණුම් ගනුදෙනු සඳහා Wide area net work ක්‍රියාත්මක කරන ලදී. |
| **2007 අපේක්ෂිත** | |
| | - බලයලත් වාණිජ බැංකුවලට ගණුදෙනුකරුවන් වෙත යොමු වූ සහභාගිකරුවන්ගේ තත්ත්වය ලබාදීම. |

**මූල්‍ය අංශය**

| | |
|---|---|
| 2006 ජනවාරි 30 | - 2006 අංක 1 දරන මුදල් සමාගම් (අවම මූලික ප්‍රාග්ධන) විධානය නිකුත් කරන ලදී. |
| | - 2006 අංක 2 දරන මුදල් සමාගම් (අවදානම් මත බර තැබූ ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාත) විධානය, මීට පෙර එම විෂය සම්බන්ධයෙන් නිකුත් කළ විධානයන් වෙනුවට නිකුත් කරන ලදී. |
| 2006 පෙබරවාරි 28 | - ජාතික ගෙවීම් මණ්ඩලයක් පිහිටුවන ලදී. |
| 2006 මාර්තු 01 | - බැංකුවල ආයෝජන කළඹ (Investment Portfolio) වර්ගීකරණය, ආගණනය හා මෙහෙයවීම, සම්බන්ධ විචක්ෂණශීලි සම්මතයන් පිළිබඳ විධානයන් සියළුම බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. මෙම විධානයන්ට අනුව, සියළුම බලපත්‍රලාභී වාණිජ සහ විශේෂිත බැංකු, ඔවුන්ගේ ආයෝජන කළඹ ආයෝජන ගිණුම් හා වෙළෙඳාම් ගිණුම් වශයෙන් කාණ්ඩ දෙකක් යටතේ වර්ගීකරණය කළ යුතුය. |
| | - වෙළෙඳපොළ අවදානම වෙනුවෙන් ප්‍රාග්ධන වියදම ගණනය කිරීමට අදාළ විධාන සියළුම බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. |
| 2006 මාර්තු 03 | - බැංකු සේවා සපයන මධ්‍යස්ථාන වර්ගීකරණයට සම්බන්ධ මාර්ගෝපදේශ සියළුම බලපත්‍රලාභී බැංකුවලට නිකුත් කරන ලදී. |
| 2006 මාර්තු 06 | - මුදල් ශුද්ධිකරණ වැලැක්වීමේ පනත සහ මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත, පනත් අංක 05 සහ 06 වශයෙන් 2006 දී සම්මත කරන ලදී. |
| | - 2006 අංක 6 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරිමෙ පනතේ විධිවිධාන අනුව මූල්‍ය බුද්ධි ඒකකයක් පිහිටුවන ලදී. |
| 2006 මාර්තු 29 | - ලංකාසෙට්ල් සහභාගීවන්නන් හා ලංකාක්ලියර් වෙත ව්‍යාපාර පවත්වාගෙන යාමේ සැළසුම්වල අවම ප්‍රමිතීන් සඳහා මාර්ගෝපදේශ නිකුත් කරන ලදී. |
| 2006 මැයි 26 | - බැංකු පනතේ 72 වන වගන්තිය අනුව සියළුම බලපත්‍රලාභී වාණිජ හා විශේෂිත බැංකු විසින් 'අත්හරින ලද දේපල' වාර්තාවක් පිළිබඳව සෑම මූල්‍ය වර්ෂයක්ම අවසන් වී මාස හයක් ඇතුළත ශ්‍රී ලංකා මහ බැංකුවට ඉදිරිපත් කළ යුතු බවට විධානයක් නිකුත් කරන ලදී. එම අත්හරින ලද දේපොල හිමිකරුට ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ හිමිකම පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත්කොට ඔහුගේ/ඇයගේ අරමුදල් ඉල්ලා සිටීමේ අයිතිය ඇත. |

2006 මැයි 19 - 2006 අංක 19 දරන විද්‍යුත් ගනුදෙනු පනත සම්මත කරන ලදී.

2006 මැයි - ඡායාගත චෙක්පත් පිළිබිඹු නිශ්කාෂන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

2006 ජූනි 01 - 2008 ජනවාරි 01 සිට බල පැවැත්වෙන, බාසල් II හි I වෙනි මූල ධර්මය යටතේ ප්‍රාග්ධන ගණනය කිරීම සම්බන්ධ කෙටුම්පත් මාර්ගෝපදේශ මාලාවක් සියළුම බලපත්‍රලාභී වාණිජ හා විශේෂිත බැංකුවලට නිකුත් කරන ලදී.

2006 ජූනි 16 - ප්‍රතිමිලදී ගැනීම් අනුපාතිකය සහ ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙලින් සියයට 9 සහ සියයට 10.50 දක්වා පදනම් අංක 25 කින් ඉහළ දමන ලදී.

2006 ජූලි 01 - සියළු බලපත්‍රලාභී බැංකු සඳහා නව අන්තර්ජාලගත දුරස්ථ පරීක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලද අතර, මෙතෙක් පැවැති ලේඛන පදනම් කරගත් වාර්තා ක්‍රමය අහෝසි කරන ලදී.

2006 ජූලි 24 - 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරන සමාගම්වල වාර්තා කිරීමේ අවශ්‍යතාවය ශක්තිමත් කිරීම සඳහා පහත සඳහන් විධානයන් 5 නැවත නිකුත් කරන ලදී.

2006 ජූලි 28 - 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරන පනතේ අංක 3 (ඇ) වගන්තිය යටතේ ලියාපදිංචි කර ඇති සමාගම්වල වාර්තා කිරීමේ අවශ්‍යතාවයන් ශක්තිමත් කිරීම සඳහා පහත දැක්වෙන විධානයන් 5 නැවත නිකුත් කරන ලදී.

- 2006 අංක 1 දරන කල්බදු මූල්‍යකරණ (අවම ප්‍රාග්ධන) විධානය.
- 2006 අංක 2 දරණ කල්බදු මූල්‍යකරණ සමාගම් (බොල් සහ අඩමාන ණය පහසුකම් සඳහා වෙන්කිරීම්) විධානය.
- 2006 අංක 3 දරන කල්බදු මූල්‍යකරණ (කේවල ණය ගැණුම්කරු සීමා) විධානය.
- 2006 අංක 4 දරන කල්බදු මූල්‍යකරණ (තෝලන අනුපාත) විධානය.
- 2006 අංක 5 දරන කල්බදු මූල්‍යකරණ (සංචිත අරමුදල) විධානය.

- පහත සඳහන් විධාන දෙකද නිකුත් කරන ලදී.
  - 2006 අංක 6 දරන කල්බදු මූල්‍යකරණ (මූල්‍ය ප්‍රකාශන) විධානය.
  - 2006 අංක 7 දරන කල්බදු මූල්‍යකරණ (සංස්ථාමය සහ මෙහෙයුම් තොරතුරු) විධානය.

2006 සැප්තැම්බර් 28 - ප්‍රතිමිලදී ගැනීම් අනුපාතිකය හා ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙලින් සියයට 9.625 හා සියයට 11.125 දක්වා පදනම් අංක 12.5 කින් ඉහළ දමන ලදී.

2006 ඔක්තෝබර් 18 - තෝරාගත් අත්‍යාවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය කිරීමේදී වාණිජ බැංකු සමඟ විවෘත කරනු ලබන සියළුම ණයවර ලිපි මත සියයට 50 ක ආන්තිකයක් මහ බැංකුව විසින් පනවන ලදී.

2006 ඔක්තෝබර් 19 - ලේඛනගත ප්‍රතිග්‍රහණය යටතේ (DA Terms) ආනයනය කෙරෙන තෝරාගත් වෙළෙඳ භාණ්ඩයන්ගේ බිල්පත් අගය මත සියයට 50 ක ආන්තික තැන්පතුවක් තැබීම අවශ්‍ය කෙරිණ. ඒ අනුව, මෙම තැන්පතුව තැබීම සඳහා අදාළ බැංකු විසින් ආයතනකරුවන්ට කිසිම අත්තිකාරමක් ලබා නොදිය යුතුයැයි නියම කෙරිණි.

2006 නොවැම්බර් 21 - නේවාසික දේපල ප්‍රාථමික උගස මත පදනම් වූ ණය හා අනෙකුත් ණය හා අත්තිකාරම් ලෙස වර්ගීකරණය කළ ණය සම්බන්ධයෙන් පිළිවෙලින් සියයට 50 ක් හා සියයට 100 ක් වූ අවදානම මත බර තැබීම, පිළිවෙලින් සියයට 55 ක් හා සියයට 110 ක් ලෙස ඉහළ නංවන ලදී.

2006 නොවැම්බර් 26 - ශ්‍රී ලංකා රුපියල් පදනම් කරගත් විදේශ ව්‍යවහාර මුදල් විකල්ප (Foreign Curency Options) පිරිනැමීමට හා ගනුදෙනුවල යෙදීමට සියලුම බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන්ට අවසර ලබාදීමේ විධානය නිකුත් කරන ලදී.

2006 නොවැම්බර් - ලංකා මූල්‍ය සේවා කාර්යාංශය පිහිටුවන ලදී.

2006 දෙසැම්බර් 06 - සියලුම ප්‍රවර්තන ණය හා අත්තිකාරම් සහ අත්හිටවූ පොලිය ඇතුළත් නොවූ සියලුම කල්පිනු ණය හා අත්තිකාරම් මත සියයට 1 ක පොදු වෙන් කිරීමක් සිදුකිරීම සඳහා සියළුම බලපත්‍රලාභී වාණිජ හා විශේෂිත බැංකුවලට විධානයක් නිකුත් කරන ලදී. 2006 දෙසැම්බර් 31 න් ආරම්භ වන කාර්තුවේ සිට සියයට 0.1 බැගින් වෙන් කරමින් මෙම අවශ්‍යතාවය කාර්තු 10 ක් තුළදී සම්පූර්ණ කළ යුතු බවට නියම කරන ලදී.

| | | |
|---|---|---|
| 2006 දෙසැම්බර් 11 | - | 2005 දී පනවනු ලැබූ අවම ප්‍රාග්ධන අවශ්‍යතාවට අනුකූලවීම සඳහා ඒ ඒ බැංකු අනුව බැංකු වලට පිළිවෙලින් 2008 අවසානය සහ 2009 අවසානය දක්වා කල් ලබාදෙන ලදී. ඒ අනුව බැංකු විසින් 2008 අවසානය වනවිට අඩුම තරමින් සියයට 50 ක්ද 2009 අවසානය වනවිට සියයට 100 ක් ද වශයෙන් අවම අවශ්‍යතාවය සම්පූර්ණ කළ යුතුය. |
| 2006 දෙසැම්බර් 13 | - | ලංකාසෙට්ල් ක්‍රමයේ සහභාගිකරුවන් අතර පියවීම් සම්බන්ධයෙන් ආචාර ධර්ම හා ප්‍රමිතීන් ලංකා සෙට්ල් සහභාගිකරුවන්ට නිකුත් කරන ලදී. |
| 2006 දෙසැම්බර් 15 | - | ප්‍රතිමිලදී ගැනීම් අනුපාතිකය හා ප්‍රති විකුණුම් අනුපාතිකය පිළිවෙලින් සියයට 10.00 සහ සියයට 11.50 දක්වා පදනම් අංක 37.5 කින් ඉහළ දමන ලදී. |
| 2006 දෙසැම්බර් 29 | - | පහත සඳහන් විධානයන් වලට අදාලව මීට කලින් නිකුත් කර තිබූ විධානයන් ඒවා නැවත නිකුත් කිරීම මගින් වෙනස් කරන ලදී.<br>- 2006 අංක 03 දරන මුදල් සමාගම් (බොල් සහ අඩමාන ණය සඳහා වෙන්කිරීම්) විධානය.<br>- 2006 අංක 4 දරන මුදල් සමාගම් (කේවල ණයගැණුම්කරු සීමා) විධානය.<br>- 2006 අංක 5 දරන මුදල් සමාගම් (ණයදීම්) විධානය.<br>- 2006 අංක 6 දරන මුදල් සමාගම් (අධ්‍යක්ෂවරුන් සහ ඔවුන්ගේ ඥාතීන් සමග ව්‍යාපාර ගනුදෙනු) විධානය.<br>- 2006 අංක 7 දරන මුදල් සමාගම් (ආයෝජන) විධානය.<br>- 2006 අංක 1 දරන මුදල් සමාගම් (ප්‍රචාරක දැන්වීම්) රීතිය. |
| 2007 ජනවාරි 02 | - | "2007 හා ඉදිරිය සඳහා මුදල් හා මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙර දැක්ම" ප්‍රකාශයට පත් කරන ලදී. |
| 2007 ජනවාරි 19 | - | බැංකුවල කොටස් හිමිකාරත්වය සම්බන්ධයෙන් නව ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිණිස බැංකු පනතට අනුව බලයලත් වාණිජ බැංකුව වෙත නව විධානයන් නිකුත් කරන ලදී. |
| 2007 පෙබරවාරි 13 | - | මූල්‍ය අංශයේ නියාමන ආයතන අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීමේ අරමුණින් අන්තර් නියාමන ආයතන සභාවක් පිහිටුවන ලදී. |
| 2007 පෙබරවාරි 14 | - | ණය තොරතුරු කාර්යාංශයේ කටයුතු පුළුල් කිරීම හා නවීකරණය කිරීම සඳහා ණය තොරතුරු කාර්යාංශ පනතට අදාළ සංශෝධන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී |
| 2007 පෙබරවාරි 20 | - | තනි පුද්ගලයෙකුට හෝ ගණුදෙනුකරුවන් කණ්ඩායමකට බලයලත් වාණිජ බැංකුවකින් ලබාදිය හැකි උපරිම ණය පහසුකම් ප්‍රමාණය සම්බන්ධ විචක්ෂණශීලී අවශ්‍යතාවයන් සඳහා බැංකු පනත යටතේ නව විධානයන් නිකුත් කරන ලදී. |
| 2007 පෙබරවාරි 23 | - | ප්‍රතිමිලදී ගැණුම් අනුපාතිකය හා ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙලින් සියයට 10.50 සහ සියයට 12.00 දක්වා පදනම් අංක 50 කින් ඉහළ දමන ලදී. |

**2007 අපේක්ෂිත**

- කෘෂි අංශයට අනිවාර්ය ණයදීම පිළිබඳ නියමයන් නිකුත් කිරීම.

  බැංකු සඳහා වූ අනිවාර්ය සමායතන පාලන රීති නිකුත් කිරීම.
- බාසල් II ක්‍රියාත්මක කිරීම සඳහා වූ අවසාන මාර්ගෝපදේශ නිකුත් කිරීම.
- ණය කාඩ්පත් කටයුතු පිළිබඳ මාර්ගෝපදේශ නිකුත් කිරීම.
- තැන්පතු බාර ගන්නා සුළු මූල්‍ය ආයතන නියාමනය කිරීම සඳහා වූ සුළු මූල්‍ය ආයතන පනත හඳුන්වාදීම.
- මූල්‍ය සමාගම් පනත සංශෝධනය කිරීම.
- ප්‍රමුඛ ඉතිරිකිරීම් හා සංවර්ධන බැංකුවේ වත්කම් හා වගකීම්, අළුතින් පිහිටුවනු ලබන ශ්‍රී ලංකා ඉතිරිකිරීම් බැංකුවට පැවරීම.